**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 අප්‍රේල් 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අප්‍රේල් 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වැය විෂයයන් 19ක ප්‍රතිපාදන ඉතිරිය, දෙපාර්තමේන්තු වැය ලෙජරය සමඟ සැසඳීමේදි රු.12,739,097 ක වෙනසක් පැවතිණි. | මූල්‍ය ප්‍රකාශනය හා වැය ලෙජරය අනුව වෙනසක් පවතින බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශය අනුව 2023 වර්ෂයේ වත්කම් මිලදී ගැනීමේ වියදම, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සමග සැසඳීමේදී රු.543,865ක වෙනසක් පැවතිණි. | සිගාස් වැඩසටහනට ඇතුලත් නොකළ වත්කම් මීට හේතු වූ බව | මූල්‍ය ප්‍රකාශන, උපයෝගී ලේඛන සමග සැසඳිය හැකි විය යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 හි මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට එම ශේෂය අතර රු.10,102,695,624 ක වෙනසක් පැවතිණි. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඈ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2023 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ගිණුමේ ආරම්භක ශේෂය සහ එදිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එම ශේෂය අතර රු.10,106,440,909 ක වෙනසක් පැවතිණි. | ජ' නල් මඟින් නිවැරදි කර ගන්නා ලද බව. | - එම - |
| (ඉ) | ශේෂ පිරික්සුමට අනුව 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම මුදල හා එදිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය අතර රු.900,000 ක වෙනසක් පැවතිණි. | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කරන බව. | - එම - |
| (ඊ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව භෞතික වත්කම් විකිණීමෙන් 2023 වර්ෂය තුළ ලද ආදායමට වඩා රු.179,645ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් විකිණීමෙන් ජනිත වූ මුදල් ශේෂය දක්වා තිබුණි. | නිවැරදි ආදායම් ශීර්ෂයට ඇතුළත් නොකිරීම නිසා මෙම අඩුපාඩුව සිදු වී තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | මූල්‍ය ප්‍රකාශනවල අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශනය අනුව වියදම් මගින් අග්‍රිම පියවීම් ශේෂය හා ශේෂ පිරික්සුමේ එම ශේෂය අතර රු.6,589,597 ක වෙනසක් පැවතිණි. | භාණ්ඩාගාරයට යැවූ අග්‍රිමය නිෂ්කාශණය නොවීම, ලද අක් මුදල් වැරදි ලෙස සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීම හා නොපියවූ අග්‍රිමයක් පැවතීම මීට හේතු වූ බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළැඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 94(i) අනුව සහ පිළිවෙලින් 2023 ජනවාරි 27 හා 2023 පෙබරවාරි 02 දිනැති අංක 01/2023 හා 02/2023 දරන අයවැය චක්‍රලේඛවලට අනුකූල නොවන ලෙස, 1101 වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.1,924,022 ක බැරකමකට බැඳී තිබුණි. එමෙන්ම, මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් රු.6,211,736ක බැරකම් සිගාස් වැඩසටහනේ යාවත්කාලීන කර නොතිබුණි. | සියලු බැරකම් දෙසැම්බර් 31 දින වන විට සිගාස් වැඩසටහනට ඇතුළත් කළ යුතු යුතු බවට උපදෙස් දීමට සටහන් කර ගත් බව. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු වේ. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ස්ථාන මාරු වී ගිය, මිය ගොස් මාස 02 සිට මාස 40 ක් කල්ගත වී තිබුණු, වැඩ තහනම් කළ ද අවසාන වාරිකය අයකර මාස 01 සිට අවුරුදු 11 දක්වා කිසිදු වාරිකයක් අය නොකළ, විශ්‍රාම ගොස් මාස 01 සිට මාස 07 ක් දක්වා කල් ගත වී තිබුණු ආදී ලෙස නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.1,331,290 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවැතිණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ පරිදි ණය අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 17ක 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනාගත් පවුල් සංඛ්‍යාව 2494 ක් වුවද, ඉන් පවුල් 736 කට 2023 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩම් ලැබී නොතිබුණි. | තෝරාගත් ඉඩම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිර්දේශ නොකිරීම, පුද්ගලයන් පෙර පදිංචි ස්ථානවලින් ඉවත් | දැනට අත්පත් කරගෙන ඇති ඉඩම් ලබා දීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වීමට ඇති අකමැත්ත, ඉඩම් සොයා ගැනීමේ අපහසුතාව ආදී කරුණු මීට හේතු වූ බව. | |
| (ආ) | ගංවතුර හා නායයෑම් නිසා 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ හානියට පත් නිවාස වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.338,402,363 ක් විය. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු රු. 312,437,884ක ශේෂයක් ද මෙම ශේෂය තුළ පැවැති අතර වන්දි ගෙවීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම මෙම ප්‍රමාදයට හේතු වී තිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදන හා අක්මුදල් නොලැබීම. | මෙම වන්දි කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.මිලියන 90ක සංවර්ධන ව්‍යාපෘති 356ක් 2023 වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කළ ද, ඉන් රු.මිලියන 3.2 ක් වූ ව්‍යාපෘති 07ක පමණක් වැඩ නිමකර තිබුණි. | ව්‍යාපෘති අනුමැතිය ප්‍රමාද වී ලැබීම, සුදුසු කොන්ත්‍රාත්කරුවන් නොවීම, ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහල යාම ආදී කරුණු මීට හේතු වී තිබුණි. | වර්ෂය තුළ අදාළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු වේ. |

## 3.2 ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඇල මාර්ගවල අවහිරතා ඉවත් කිරීමේ ව්‍යාපෘති 03ක් ආරම්භ නොකිරීම නිසා රු. 550,000ක් වූ මුළු ප්‍රතිපාදනයම නැවත පවරාගෙන තිබුණි. එමෙන්ම, ප්‍රජා දායකත්වය මඟින් කළ හැකි ව තිබුණු ඇල මාර්ග 04 ක් පිරිසිදු කිරීමේ ව්‍යාපෘති සඳහා රු.1,934,997 ක් රජයේ වියදමින් සිදුකර තිබුණි. මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී දරන ලද පිරිවැයට ප්‍රතිලාභ පවතී ද, ආපදා අවම කිරීමේ අරමුණු ඉටු වේද හා ඒවායේ පසුවිපරම් කටයුතු නිවැරදිව සිදුවන්නේ ද යන්න අවිනිශ්චිත විය. | අධික ලෙස වර්ෂාව පැවැතීම නිසා ප්‍රතිපාදන නැවත පවරා දීම හා ගොවි සංවිධාන දැනුවත් කර ප්‍රජා දායකත්වය ලබා ගැනීමට කටයුතු කරන ලෙස නිළධාරීන් දැනුවත් කළ බව. | අවශ්‍යතා හඳුනා ගෙන නිසි පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12ක වූ රජයේ ගොඩනැගිලි 107ක් අභාවිතව පැවතුණි. | අබලන්ව පැවැතීම හා නාය යෑමේ අවදානම මීට හේතු වූ බව | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වූ වාහන 10 ක් වසර 03ත් වසර 06ත් අතර කාලයක සිට අභාවිතව පැවතිණි. | ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | - එම - |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවාස 38 න් නිවාස 07ක් වර්ෂ 05කට වැඩි කාලයක සිට අභාවිතව තිබීම නිසා එම නිවාස කැලෑවෙන් වැසී පැවති අතර දොර ජනෙල් සොරුන් රැගෙන ගොස් තිබුණි. එම නිවාස මත්ද්‍රව්‍ය ඇතුළු විවිධ දූරාචාර සඳහා භාවිතා කරන අතර අනවසරකරුවන් පදිංචි වීමේ අවදානමක් ද පැවැතිණි. නිවාස පොරොත්තු ලේඛනයේ සිටින නිළධාරීන් 77 දෙනෙකුට රජයේ නිවාස ලබා ගැනීමේ ප්‍රමාදයක් ද මේ නිසා පැවැතිණි. | ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් මෙම නිවාස අළුත්වැඩියා කිරීමට නොහැකි වී ඇති බව. | - එම - |

**3.4 පාඩු හා හානි**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව, මියගිය විශ්‍රාමිකයින් පිළිබඳ දැනුම් දීම ග්‍රාම නිලධාරින් විසින් පැහැර හැරීම නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක මියගිය විශ්‍රාමිකයින් 34 දෙනෙකු සඳහා රු. 2,431,492 ක් විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව | වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක වූ විශ්‍රාමිකයින් 131 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප්වලින් 2023 දෙසැම්බර් 22 දිනට රු.16,763,098 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවැතිණි. | අය වෙමින් පවතින බව | - එම - |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා වේයන්ගෙන් සිදුවන හානි වැළැක්වීමට රු.298,116ක් ගෙවා තිබුණි. එහෙත්, ගබඩාවේ වේයන් මතු වී ලිපිගොනු හා ලේඛන විනාශ කර තිබුණි. 2023 වර්ෂය වන විට වසර 10ක වගකීම් කාලයෙන් වර්ෂ 05ක් ගත වී තිබුණ ද, එම වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු මඟින් නැවත ප්‍රතිකර්මයක් කරවා ගෙන නොතිබුණි. | මේ සඳහා කොන්ත්‍රාත්කරුට උපදෙස් දුන් බව. | ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3.5 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුවිට නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ ජලනල එළීමේ ව්‍යාපෘතිය, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීම මඟින් කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම වෙනුවට රු.මිලියන 11.96 ක් වූ කොන්ත්‍රාත්තුව කොටස් 04කට බෙදා ප්‍රජා මූල සංවිධාන වෙත පවරා තිබුණි. එමෙන්ම, බට අතුරා නැවත පිරවීමේදී පැවැති පස් යෙදීම පිළිබඳ අධ්‍යයනය කිරීම වෙනුවට මිල අධික වැලි යොදා කානු පිරවීම නිසා කොන්ත්‍රාත් වටිනාකමින් රු.මි. 9.67ක් එනම් සියයට 87ක් වැනි විශාල පිරිවැයක් මේ සඳහා දැරීමට සිදු වී තිබුණි. | සුදුසුකම් ලත් සමිති වෙත ව්‍යාපෘතිය භාරදුන් බව හා පාංශු පරීක්ෂණය සිදු කර නොමැති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා වියදම් දැරීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |

## 3.6 නිෂ්ඵල වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 09ක පවුල් ඒකක 973ක් වෙත කුකුළු පැටවුන් 10522 ක් ලබා දී තිබුණි. ඉන් රු.1,489,500 ක පැටවුන් 3288 ක් මිය ගොස් තිබීම, පැටවුන් මිල දී ගැනීමට පෙර රජයේ පශු වෛද්‍ය නිර්දේශය ලබා නොතිබීම, පසුවිපරමක් නොතිබීම, කෑම මිල අධික නිසා වෙනත් ආහාර දීමෙන් බිත්තර නොදැමීම, ප්‍රසම්පාදන පිරිවිතරයන්ට අනුව කිකිළි පැටවුන් 09කට එක් කුකුළෙකු යන අනුපාතය අනුගමනය කර නොතිබීම ආදී හේතු මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | ස්වභාවික ආපදා, රෝගාබාධ, වැනි ප්‍රතිලාභීන්ට පාලනය කළ නොහැකි හේතු මෙන්ම ප්‍රතිලාභීන්ට ව්‍යාපෘතිය පිළිබඳ අත්දැකීම් නොතිබීම මත ද අපේක්ෂිත අරමුණ ඉටු වී නොමැති බව. | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 05ක පවුල් 119කට රු.691,324 ක් වූ මුං බීජ කි.ග්‍රෑම් 598ක් කි.ග්‍රෑම් 19623 ක අස්වැන්නක් අපේක්ෂා කරමින් බෙදාහැර තිබුණද, ලද අස්වැන්න කි.ග්‍රෑම් 5695 ක් විය. බීජ නුසුදුසු වීම, යක් මුං ඇට වැඩි ප්‍රමාණයක් අස්වැන්න තුළ තිබීම, ගොවීන් හා වගා භූමි තෝරා ගැනීමේදී අවශ්‍ය නිර්නායක ඇගයීමට ලක්කර නොතිබීම ආදී හේතු මත මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. | කාලගුණික විපර්යාස හා සත්ව උවදුරු මෙම තත්ත්වයට බල පෑ බව | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඈ) | බලංගොඩ ප්‍රදේශයේ පවුල් ඒකක 20ක් සඳහා රු.799,200ක් වැයකර කුරුඳු පැල 33300ක් ලබා දී තිබුණි. නියැදියක් ලෙස පැල 8100ක් පරීක්ෂාවේදී පැල 2250ක් එනම් සියයට 28ක් මිය ගොස් තිබුණි. එම ප්‍රදේශයේ උග්‍ර ජල හිඟයක් පැවැතිය ද, පාරිසරික අධ්‍යයනයක් නොකිරීම මීට හේතු වී තිබුණි. | තද නියග තත්ත්වය හේතු වූ බව | - එම - |
| (ඇ) | උසස් නිමාවකින් යුතුව දැවයෙන් නිර්මිත වේදිකාවක් සංස්කෘතික මධ්‍යස්ථානක මූලික අවශ්‍යතාවකි. එහෙත්, ඕපනායක සංස්කෘතික මධ්‍යස්ථානයේ වේදිකාව ප්‍රමිතියකට ඉදිකර නොතිබුණි. එනම්, වේදිකා රාමුව මත ලෑලි විසුරුවා තිබුණු අතර ඉන් බොහෝ ලෑලි දිරාපත්ව පැවැතිණි. මෙම වේදිකාවේ ඉදිකිරීම් නිවැරදි බවට සහතික කළ කාර්මික නිලධාරි නිර්දේශ ද ගැටළු සහගතය. නර්තන හා විවිධ රංගන, සංස්කෘතික මධ්‍යස්ථානයක මූලික ඉදිරිපත් කිරීම් වේ. එහෙත්, එවැනි මූලික අවශ්‍යතා කිසිවක් මෙම සංස්කෘතික මධ්‍යස්ථානය මගින් සම්පූර්ණ කරගත නොහැකි වීම නිසා ප්‍රමිතිගත වේදිකාවක් ඉදිකරන තෙක් මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් වැය කළ රු.4,110,568 ක මුදල නිෂ්ඵල වියදමක් විය. | රුඳවුම් මුදල් නිදහස් කර නොමැති බැවින් අවශ්‍ය කටයුතු කරන බව | - එම - |
| (ඉ) | වේවැල්කඳුර හෝටන්වත්තේ කෝවිලේ ඉදි කිරීම් 2022 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, එහි ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. මේ වන විට එම භූමිය ද වල් වැදී තිබීම නිසා වැය කළ රු.290,899ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහලයාම හා හිඟවීම මීට හේතු වූ බව. | - එම - |
| (ඊ) | රුපියල් මිලියන 18.5ක් වැයකර 2022 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත කළ CCTV කැමරා පද්ධතිය වර්ෂයකටත් වඩා වැඩි කාලයක සිට නිෂ්කාර්යයව පවතී. | අනිකුත් උපාංග ලබා ගෙන සක්‍රීය කිරීමට කටයුතු කරන බව. | - එම - |

**3.7 කළමනාකරණ දූර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම්වල වැලි, කලු ගල්, පෙල්ස්පාර්, තිරිවානා, කැල්සයිට් හා ඩොලමයිට් යන ඛණිජ කැනීම් සඳහා බලපත්‍ර ලබා දීමේදී එම ඛණිජ ද්‍රව්‍යයට අදාළ පුරස්කාරයට අමතරව 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන සහ 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරන අති විශේෂ ගැසට් නිවේදනවලට අනුකූලව කියුබ් ප්‍රමාණය මත ගාස්තු අයකිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් කටයුතු කර නොතිබුණි. | අයකිරීම් කටයුතු කඩිනමින් කරන බව | අදාළ ගැසට් නිවේදනය පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.25,850,000ක වියදමින් ඉදිකළ නිවාස 22ක ගොඩනැගිලි අයදුම්පත්, 2017 වර්ෂයේ සිට මේ දක්වා කුරුවිට ප්‍රාදේශීය සභාව මඟින් අනුමත නොකිරීම නිසා යළි පදිංචි කිරීමේ කටයුතු අවසන් කළ නොහැකි වී තිබුණි. | මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව | අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබාගත යුතු වීම. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 06ක රු.3,377,579 ක ශේෂයක් සහිත බැංකු ගිණුම්, මාස 06 සිට වර්ෂ 04 දක්වා කාලයක සිට අභාවිතව පැවැතිණි. | ඉදිරියේදී ණය ලබා දීමට කටයුතු කරන බව | බැංකු ගිණුම් සක්‍රීය කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 11ක ග්‍රාම නිලධාරී කාර්යාල පිහිටා ඇති රජයේ ඉඩම් 112 ක හිමිකාරත්වය ප්‍රාදේශීය ලේකම් පවරා ගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව | වත්කම්වල අයිතිය පවරාගත යුතු වීම. |
| (ඉ) | ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයක් සමඟ එක්ව පරිගණක වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. එම ආයතනය මිල කැඳවීමකින් හා පිරිවිතර සලකා බැලීමකින් තොරව තෝරාගත් ආයතනයක් විය. මේ වන විට මාස 19ක කාලයක් මෙම පරිගණක වැඩසටහන භාවිතා කළ ද කිසිදු ආකාරයක ගිවිසුම්ගත වීමත් සිදු වී නොමැති අතර ඊට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ වෙනත් යම් ආකාරයක හෝ අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි. | ලිඛිත අනුමැතියක් ලැබීමෙන් පසු විධිමත් පරිදි මෙම පද්ධතිය භාවිතා කිරීමට කටයුතු කරන බව | අනුමැතියක් හා ගිවිසුම්ගත වීමක් නොමැතිව ව්‍යාපෘති ක්‍රියාත්මක නොකළ යුතුය. |

## 3.8 මෙහෙයුම් දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිළිඳු පවුල් සවිබල ගැන්වීම වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.21,302,688 ක භාණ්ඩ හා පැළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක ප්‍රතිලාභීන් 521 දෙනෙකු වෙත බෙදා දී තිබුණි. 2023 නොවැම්බර් වන විට මෙම භාණ්ඩ හා පැළ බෙදාහැරීම සිදුකර වර්ෂ 02ක් ඉක්ම වී ගොස් තිබුණ ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණු අතර සවිබල ගැන්වී ඇති ප්‍රතිලාභීන් හඳුනාගැනීමක් හෝ හඳුනාගැනීමට ක්‍රමවේදයක් හෝ සකස්කර නොතිබුණි. | සවිබල ගැන්වීම් හා පසුවිපරම් කටයුතු සිදු කරමින් පවතින බව | සංවර්ධන ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13ක ක්‍රියාත්මක සමෘද්ධි බැංකු 36ක් විසින් ලබා දුන් ණය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට මාස 09ට අඩු කල් පසු වූ ණය සහ මාස 09ට වැඩි බොල් ණය පිළිවෙලින් රු.357,478,987 සහ රු.208,148,406 ක් විය. | ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | බොල් ණය හා කල් පසු වූ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඇලපාත ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන් 184 දෙනෙකු වෙත රු. 8,083,133ක භාණ්ඩ හා පැළ වර්ග බෙදා දී 2023 දෙසැම්බර් මාසයට වර්ෂ 02ක් පමණ ගත වුවද, ඒ වන තුරුත් එම ප්‍රතිලාභීන් සවිබල ගැන්වී ඇති බවට හඳුනා ගෙන නොතිබුණි. | ඉදිරියේදී සවිබල ගැන්වීමට කටයුතු කරන බව | ව්‍යාපෘති විධිමත්ව අධීක්ෂණය කළ යුතුය. |

**3.9 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කළ අමාදහර පොසොන් කලාපය - 2023 සඳහා අවිධිමත් ලෙස මූල්‍ය කමිටුවක් පිහිටුවා මුදල් රෙගුලාසි 170(2) ට පටහැනිව ලදුපත් නිකුත් කිරීමකින් ද තොරව මහජනතාවගෙන් රු.1,304,000ක්, අයකර තිබුණි. එම මුදලින් රු. 1,296,446ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් හා වවුචර් පිළියෙල කිරීමකින් තොරව වැයකර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත් වීමක් සිදු වී නොමැති බවත්, අවශ්‍ය මුදල් සියල්ල පුද්ගලික අනුග්‍රාහකයින් විසින් සිදු කර ඇති බවත් | අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතිරික්ත සේවකයන් 342 දෙනෙකුගේ සේවා අවශ්‍යතාව හඳුනාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හෝ ඵලදායි ලෙස වෙනත් ආයතන වෙත අනුයුක්ත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | කිසිදු නිළධාරියෙකු අතිරික්ත ලෙස සලකා කටයුතු නොකරන ලෙසත් උපදෙස් දී ඇති බැවින් මෙම කාර්යය දිස්ත්‍රික් ලේකම්ගේ පාලනයෙන් බැහැරව පවතී. | අදාළ තනතුරු අනුමත කරගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08කට අනුයුක්ත කර තිබුණු බහුකාර්යය සේවකයින් සඳහා 2023 වර්ෂයේදී රු.175,676,491ක් ගෙවා තිබුණ ද, නිශ්චිත කාර්ය පැවරුමක් නොතිබුණි. එහෙත්, ආරක්ෂක හා පවිත්‍රතා සේවා සඳහා ඔවුන් යොදා නොගෙන එම කාර්යයන් බාහිර ආයතන වෙත පවරා 2023 වර්ෂය වෙනුවෙන් රු.7,688,762ක් ගෙවා තිබුණි. | අවශ්‍ය කටයුතු කරමින් පවතින බව සහ ටෙන්ඩර් පටිපාටියට අනුව ආරක්ෂක හා පවිත්‍රතා සේවා ලබා ගෙන තිබීම | වියදම්, කළමනාකරණය කළ යුතුය. |